# ECHO OF HIS CALL

# කැඳවීමේ ප්‍රතිරාවය

SINHALA

ECHO OF HIS CALL 1969-2019 GOLDEN JUBILEE

India's National Spiritual Newspaper

₹ 10/-

Published monthly in ENGLISH, TAMIL, MALAYALAM, TELUGU, HINDI, KANNADA, MARATHI, BENGALI, GUJARATI, ODIYA, ASSAMESE, PUNJABI, NEPALI, URDU, SINHALA & AFRIKAANS

Editor : S. SAM SELVA RAJ

16 Languages

Vol. XIV YEAR OF OUR LORD JESUS CHRIST, AUGUST 2020 Issue No. 10

## ශුද්ධවූ බයිබලය
## (ගීතාවලිය 138:1-8)

1. මාගේ මුළු සිතින් ඔබට ස්තුති කරන්නෙමි. දෙවිවරුන් ඉදිරියෙහි ඔබට ගීයෙන් ප්‍රශංසා කරන්නෙමි.
2. ඔබගේ ශුද්ධ මාලිගාව දෙසට නමස්කාර කරමින්, ඔබගේ කරුණාගුණය සහ සත්‍යය නිසා ඔබගේ නාමයට ස්තුති කරන්නෙමි. මක්නිසාද ඔබගේ මුළු නාමයට ඉහළින් ඔබගේ වචනය උතුම්කළ සේක.
3. මා ඔබට අඬගැසූ දවසේදී ඔබ මට උත්තර දී මාගේ ආත්මය ශක්තිමත් ධෛර්යදුන්සේක.
4. ස්වාමිනි, පොළොවේ සියලු රජවරු ඔබගේ අභිමුඛයේ වචනය ඇසූ බැවින් ඔබට ස්තුති කරන්නෝය.
5. එසේය, ස්වාමින්ගේ මහිමය උතුම් නිසා, ඔව්හු ස්වාමින්ගේ මාර්ගය ගැන ගීතිකාකරන්නෝය.
6. මක්නිසාද ස්වාමින්වහන්සේ උසස් නුමුත් පහත් අය සලකනසේක. නුමුත් උඩඟු අය දුර දීම දන්නාසේක.
7. මම විපත්ති මැද හැසිරෙම් නුමුත් ඔබ මා ප්‍රාණවත් කරනසේක, ඔබ මාගේ සතුරන්ගේ උදහසට විරුද්ධව ඔබගේ හස්තය ද දිගුකරනසේක.
8. ස්වාමින්වහන්සේ මා සම්බන්ධ කාරණය සම්පූර්ණ කරණසේක. ස්වාමිනි, ඔබගේ කරුණාව සදාකල් පවත්නේය. ඔබගේ හස්තකර්ම අත් නොහළ මැනව.

# දෙවියන්වහන්සේගේ අභිමුඛත්වයේ බලය

මෙම ලිපියෙහි ඇති සම්පූර්ණ පණිවිඩය සර්වබලධාරී දෙවියන්වහන්සේගේ අභිමුඛත්වයෙහි තිබෙන්නාවූ බලය ගැනත් එම බලය අප අත්පත් කරගන්නේ කෙසේද කියාත් ඇති පණිවිඩයයි. ඒ සඳහා දේව වචනයෙහි බොහෝ උදාහරණ දක්වා ඇත. එම මහා බලසම්පන්න අත්දැකීම මෝසෙස්ගේ ජීවිතය තුළ අපට දැක ගත හැකිය.

දෙවියන්වහන්සේගේ අභිමුඛත්වය ඔහු සමඟ නොතිබුණේ නම් ඔහුට කිසි දෙයක් කිරීමට නොහැකි බව මෝසෙස් දැනගෙන සිටියේය. ඔහු දෙවියන්වහන්සේ සමඟ මුහුණට මුහුණලා කථා කළ අවස්ථාවේදී ඔහු පවසනු ලැබුයේ, ***''ඔබවහන්සේම නොයන සේක් නම් මෙතැනින් අප ගෙන නොගිය මැනව.'' (නික්මයාම 33:15)***

එනම් ඔහු මෙහිදී පවසනු ලැබුයේ, ''ස්වාමිනී, ඔබගේ අභිමුඛය මා සමඟ ගියේ නැතිනම් මා මෙතැනින් කොහොටවත් යන්නේ නැහැ. ඔබවහන්සේ මාත් සමඟ සිටින බව ස්ථිරතාවයක් නැතිනම් මම මෙතනින් එක අඩියක්වත් නොයමි.'' කියාය.

අන් සියලු ජාතීන්ට වඩා ඉශ්‍රායෙල් ජාතියව රැකගත්තේ දෙවියන්වහන්සේගේ අභිමුඛත්වය පමණක්ම බව මෝසෙස් දැනගෙන සිටියේය. අදටත් කිතුණු සභාවට මෙය අදාල වන්නේය. අපට මඟපෙන්වීම හා උන්වහන්සේගේ ක්‍රියාකාරීත්වය අප සමඟ තිබෙන්නේ දෙවියන්වහන්සේ අප සමඟ සිටින නිසාය.

අන්‍ය ජාතීන්ට මඟපෙන්වීම ලැබුනේ කෙසේද? ඔවුන් සැලසුම් ලබාගන්නේ කෙසේද? ඔවුන්ගේ රාජ්‍යය ඔවුන් පාලනය කළේ කෙසේද? කියන ප්‍රශ්නය ඔහුට තිබුනේ නැත. නුමුත් මෝසෙස් පවසනු ලැබුයේ, ''අපට ඇත්තේ එකම එක ප්‍රතිපත්තියයි. සෑම යුද්ධයකදීම සෑම ගමන් මාර්ගයකදීම අපට දෙවියන්වහන්සේගේ මඟපෙන්වීම හා උන්වහන්සේගේ අභිමුඛත්වය පමණක් අප හා සමඟ තිබිය යුතුය.'' කියාය.

දෙවියන්වහන්සේගේ අභිමුඛත්වය අප හා සමඟ තිබේ නම්, කිසිවෙකුටත් අපට හානියක් කිරීමට නොහැකිය. නමුත් උන්වහන්සේගේ අභිමුඛත්වය නැතිනම් අප අසරණ වන්නේය. මේ ලෝකය තුළ සිටින්නන් ඔවුන්ගේ රථ කෙරෙහි හා ඔවුන්ගේ බලය විශ්වාස තැබූ නමුත් අපගේ එකම බලාපොරොත්තුව හා විශ්වාසය නම්, ස්වාමීන්වහන්සේගේ අභිමුඛත්වය අප හා සමඟ තිබෙන බවයි.

දෙවියන්වහන්සේ මෝසෙස්ගේ ඉල්ලීමට පිළිතුරු දෙනු ලැබුයේ මේ ආකාරයටය. ***''.....මම නුඹ සමඟ ගොස් නුඹට නිවාඩු දෙන්නෙමියි.'' (නික්මයාම 33:14)*** යනුවෙනි. මෙය කොපමණ අනර්ඝ වූ පොරොන්දුවක්ද? එනම්, දෙවියන්වහන්සේ ඔහුට

***3 වෙනි පිටුවට ...***

*Touching lives by Teaching ....... Since 1969*

# කැඳවීමේ ප්‍රතිරාවය

**"භය නොවී නොකැලඹී බලවත්ව සව්ව සිටපල්ලා.." (1 ලේකම් 32:7)**



**යේසුස් ක්‍රිස්තුස්වහන්සේ තුළ ප්‍රිය මිත්‍රවරුනි, අපගේ ස්වාමි වූ ගැළවුම්කාර යේසුස් ක්‍රිස්තුස්වහන්සේගේ අනර්ඝ වූ නාමයෙන් ඔබට සුභ පැතුම් ගෙනෙමි. අපගේ යාච්ඤාවේ දී අප බලාපොරොත්තු වන්නේ ඔබගේ ජීවිතයේ සෑම අංශයක් කෙරෙහිම දෙවියන්වහන්සේගේ බලයෙන් ආවරණය කරන්නය කියාය.**

මේ දිනවලදී ලෝකයේ බොහෝ රටවල ශුද්ධාත්මයාණන්වහන්සේගේ වැගිරීම ගැන හා ක්‍රියාකාරීත්වය ගැන බොහෝ සාක්ෂි අපට අසන්නට ලැබෙනවා. යේසුස්වහන්සේව නොදැන සිටි බොහෝ දෙනා උන්වහන්සේ වෙතට හැරී එන බවත් අපට සැලවෙනවා. සභාව තුළද කිසිදු භේදයකින් තොරව යේසුස් ක්‍රිස්තුස්වහන්සේ වෙතට මනුෂ්‍යයන් දිනා ගන්නා සියලු දෙනා එක්ව ක්‍රියා කරන බව අපි දනිමු. මේ සෑම දේ උදෙසාම අපි දෙවියන්වහන්සේට ස්තුති කරමු.

ලෝකයේ ආත්මිකව සිදු වෙන්නා වූ සියලු සිදුවීම් නිවැරදිව ප්‍රකාශ කරන්න හා එළිදක්වන්නය මාධ්‍යවේදීන්ට උපකාර කරන්න කියා අප අපගේ යාච්ඤා වලදී ඉල්ලිය යුතුය. ඕනෑකමින් යුතුව ඒ ගැන යාච්ඤා කළ යුතුය. මන්ද ලෝකය තුළ දෙවියන්වහන්සේ විසින් කරන්නාවූ බොහෝ දේ අද මාධ්‍ය තුළින් එළිදක්වන්නේ නැත. එම නිසා සෑම පුවත්පත් රූපවාහිනිය, අන්තර්ජාලය, වට්ස්අප් ආදී මාධ්‍ය තුළින් දෙවියන්වහන්සේ පුදුම ලකුණු හා ක්‍රියාවන් එළිදරව් වෙන්නය කියා අප යාච්ඤා කරමු. එමෙන්ම යාච්ඤා වීරයන් මහන්සියෙන් වැඩ කරන්නාවූ අය දෙවියන්වහන්සේගේ අය දෙවියන්වහන්සේ සැම තැනම තබා ඇති නිසා අපි උන්වහන්සේට ස්තුති කරමු. සෑම පළතකම අප විසින් කරනු ලබන ධර්ම දූත සේවයේ බලවත් පිබිදීමක් ඇති වී තිබේ.

ජනවාරි මස 9 වන දින අප සේවයට යන අතර තුරදී ඉතා අලුයම 12.30 ට තිරනෙල්වේලි නම් ස්ථානයේදී අප විවේකාගාරයක නතර වූ අතර එහි තිබූ ආපන ශාලාවකට අපි ගියෙමු. අප එහි ගොස් කෝපි පානය කරමින් සිටින අතර අප වාඩිවී සිටි ස්ථානයට ඉදිරිපිට නව යුවලක් අප දෙස බලාගෙන සිටි  ක්ෂණිකවම ඔවුන් අප වෙතට පැමිණ මා බදාගෙන මෙලෙස පවසනු ලැබීය.

සහෝදර සෑම් ඔබට අපිව හඳුනා ගැනීමට පුළුවන් ද? මා දේවගැති රාමදාස්ය. මා 1992 සිට 1994 වන වසර දක්වා චෙන්නායි වල ඔබගේ නෙහෙමියා බයිබල් විදුහලේ ඉගෙන ගත්තෙමි. මට එදා ඉගැන්වූ ගුරුවරයා නම් ඔබයි. ඒ කාලයේ දී මා චෙන්නෙයි වල ''දින තන්ති'' නැමැති පුවත් පතේ සේවය කළෙමි. දිනක් ඔබ පූර්ණකාලීව සේවයට පැමිණුනේ කෙසේද කියාත් ඔබ රැකියාව අත්හැර සේවයට පැමිණුන විට දෙවියන්වහන්සේ ඔබට සාර්ථක ජීවිතයක් ලබා දුන්නේය කියාත් පැවසීය. මා එය ඇසූ පසු මමද පූර්ණකාලීන සේවයට පැමිණ අද දක්වාම එම සේවයෙහි නියුතුව සිටිමි. අද දෙවියන්වහන්සේගේ සේවයට අවශ්‍ය ගොඩනැගිලි, වාහන, සේවකයන් ආදී සියලුම ආශිර්වාද ලබා දී තිබේ. අපගේ තැපැල් මාර්ගික බයිබල් පාඩම් මාලාව අප භාෂා 3 කින් පවත්වන බව ඔබ දන්නවා ඇත. එය ඉන්දියාවේ සිටින දහස් ගණනකට ආශිර්වාදය ලබා දෙනු ඇත. එයින් ආශිර්වාදය ලැබූ පුද්ගලයින් දෙදෙනෙකුගේ ලිපි මා පහත සඳහන් කරමි.

සහෝදරී ඇනාපූර්ණා ඇන්ඩ්‍රා ප්‍රදේශයේ සිට මෙම ලිපිය ලියමි.

''මා ඇනැපූර්ණා මට ඔබගේ තැපැල් මාර්ගික බයිබල් පාඩම්මාලාව ලැබුණා. ඒ සමඟම මට ඔබගේ 'නව ජීවිතය' යන පොත ද ලැබුණා. මා එය ඉතා ඕනෑකමින් කියෙව්වෙමි. මා එම පාඩම්මාලාව කරන විටදී කිතුණු ජීවිතය තුළ ජීවත් විය යුත්තේ කෙසේද කියා මට තේරුණි. පසුව මා එලෙස ජීවත්වීමට ඉගෙන ගත්තෙමි. මා එම පාඩම් මාලාව තුළින් ආශිර්වායද ලැබුවෙමි. ඔබ මට මෙය එවූ නිසා මා ඔබට ස්තූති කරමි. එමෙන්ම 2020 වසර සඳහා ඔබ එවා තිබූ බයිබල් කියවීමේ සැලැස්ම හා පොරොන්දු පදයද මා හට ලැබුණි. එයට ඔබට බොහෝම ස්තුති කරමි. මේ වසරේ සිට සෑම මසකම මේ සේවය උදෙසා රු.200/- ක මුදලක් එවීමටද මා පොරොන්දු වෙමි. දෙවියන්වහන්සේ ඔබටත් ඔබගේ පවුලටත් ආශිර්වාද කරන සේක. අප උදෙසාද යාච්ඤා කරන්න.




CHIEF EDITORS
Pastor S. Sam Selva Raj
Angeline Selvakumari Henry, M.A., M.Ed.
MANAGING EDITOR
Pastor Alex Samson Sam, B.Th., M.Div.
ADMINISTRATION
Bro. N. Prakasam, M.A., General Manager
EDITORIAL BOARD
Sis. Jesy Veena Sam
Bro. M. Paulraj, M.A., B.Ed.
Sis. Serena Bevin, M.A., M. Phil., B.Ed.
ADVISORY BOARD
Adv. Jose Abraham
Adv. N. Balaji, B.Com., B.L.
Dr. S. Rabinder Boaz, M.S.
Er. C.G.S. Baburao, B.Tech., M.Tech. (DM)
Aud. K. Puratchivendan, M.Com., B.L.
Bro. Rajeswaran Samuel, B.Com.

PUBLISHER & PRINTER
Pastor S. SAM SELVA RAJ
Echo of His Call Printers
10, Mohammed Abdullah 2nd Street,
Chepauk, Chennai- 600 005, India.
Phone : (+91-44) 2852 8282
2852 9293, 2854 7766
Email : sam@echoofhiscall.org
biblecor@yahoo.co.in
Websites :
www.echoofhiscall.org
www.echoofhiscall.com

**Our Ministries:** ECHO OF HIS CALL Monthly Magazines (16 languages) BIBLECOR - Postal Courses (3 languages) Theological Correspondence Courses (2 languages) Church Planting Nehemiah Bible Colleges Gospel Printing Press Great Commission Partners Village English High School Crusades 24 Hour Prayer Ministry Community Development

එමෙන්ම මෙම බයිබල් පාඩම් මාලාව නෙහෙමියා බයිබල් විදුහලෙන් ඉගෙනගත් මෝහන්දාස් විසින් කේරළ සිට එවූ ලිපිය පළ කිරීමට අප කැමැත්තෙමු.

මම නෙහෙමියා බයිබල් විදුහලේ තැපැල් මාර්ගික බයිබල් පාඩම් මාලාව ඉගෙන ගත්නා කාලයේ දී දෙවියන්වහන්සේ ගැන මට හොඳ දැන ගැනීමක් හා දේව වචනයේ එළිදරව් ගැන ඉගෙන ගැනීමට හැකි විය. මෙම පාඩම් මාලාවන් තුළින් මට හොඳ මඟපෙන්වීමක් ද ලැබුණි. සභාව ගැන ඉගෙන ගත්තාවූ දේ මට දේශනා කිරීමටත් දේව වචනය පරිවර්තනය කිරීමටත් ප්‍රඥාව ලබා දුන්නේය. එම නිසා නෙහෙමියා බයිබල් විදුහල ගැනත් මෙම පාඩම් මාලාව ගැනත් මා දෙවියන්වහන්සේට ස්තුති කරමි. මෙය කරණකොටගෙන දෙවියන්වහන්සේගේ වචනය මා හරියාකාරව ඉගෙන ගත්තෙමි. පාස්ටර් සෑම් සෙල්ව රාජ් ඔබ මට බොහෝ ආකාරයෙන් උදවු උපකාර කරමින් මා ධෛර්‍යමත් කළේය. ඔබගේ ජීවිත රටාව තුළින් මා බොහෝ දේ ඉගෙන ගත්තෙමි. ඔබ කරන්නාවූ විශාල සේවය ගැන මා අගය කරමි. ඔබ අපට මහගු ආදර්ශයකි. තව දුරටත් ඔබගේ මෙම සේවය වර්ධනය කර ගනිමින් ඉදිරියටම කරගෙන යන පිණිස මා ඔබටත් ඔබගේ කණ්ඩායමටත් සුභ පතමි. ස්වාමීන්වහන්සේ ඔබට ආශීර්වාද කරයි.

මෙයට
මොහාන්දාස්

ජනවාරි මස 25 වන දින අප සභාවේ කූඩාරම් මංගල්‍යයක් පැවැත්වීමට දෙවියන්වහන්සේ අපට උපකාර කළේය. ඔබ විසින් මෙම දීර්ඝ ලිපිය කියවීම ගැන මා ඔබට ස්තුති කරමි. කරුණාකර අපගේ සියලු කර්තෘවරු නිසාත් යාච්ඤා හවුල්කාරයින් නිසාත් සහය දෙන අය නිසාත් පාලකවරුන් නිසාත් අපගේ ධර්මදූත සේවකයින් නිසාත් කාර්‍යාලයේ සිටින සේවකයින් නිසාත් බයිබල් පාසල හා මුද්‍රණාලයේ වැඩ කරන අය නිසාත් දෙවියන්වහන්සේට යාච්ඤා කරන්න.

එමෙන්ම අප කැඳවීමේ ප්‍රතිරාවය සේවයේ 51 වන වසරට පා තැබුවෙමු. කැඳවීමේ ප්‍රතිරාවය සේවය උදෙසා මැයි මස 1 වන දින අපි විශේෂ යාච්ඤාවක් පවත්වමු. අපි ඔබ සැම දෙනාටම ආශිර්වාද කරමු. දෙවියන්වහන්සේ ඔබටද ආශිර්වාද කරන සේක්වා.

**ක්‍රිස්තුස්වහන්සේ තුළ ඔබගේ සේවක,**
**එස්. සෑම් සෙල්ව රාජ්**

---

***1 පිටුවෙන්....***

පවසනු ලැබුයේ, 'සතුරා කුමන ආකාරයකට ඔබ වෙතට පැමිණුනත් ඔබට මා තුළින් නිවාඩුවක් ඇත.' කියාය.

මේ ගැන මොහොතක් සිතන්නඃ සභාව තුළ දෙවියන්වහන්සේගේ අභිමුඛත්වය ක්‍රියා කරනවා නම්, ඒ සභාව තුල ගැටුමක් හෝ ප්‍රශ්නයක් හටගන්නේ නැත. නමස්කාරය, ගායනය, දේශනාව ආදී දේ තුලින් දෙවියන්වහන්සේගේ අභිමුඛත්වය පිරී තිබේ නම්, සෙනගගේ මනස තුළ මහත් වූ ප්‍රීතියක් හටගැනෙනු ඇත. සභාව තුලට ඇතුල්වන අයටද මෙම අත්දැකීම ලැබිය හැක.

දෙවියන්වහන්සේගේ අභිමුඛත්වය සභාව සමඟ තිබෙන කල්හි සෑම විටම සතුටින් හා සමාදානයෙන් අපට නමස්කාර කිරීමට හැකිය.

එසේම සෑම ඇදහිලිවන්තයකුගේම ජීවිතය තුළ දෙවියන්වහන්සේගේ අභිමුඛත්වය තිබේ නම් ඔවුන්ගේ ජීවිතය තුළ දෙවියන්වහන්සේගේ පිළිවෙල, සමාදානය හා නිහඬතාවය සෑම විටම තිබෙනු ඇත. සෑම දෙයක්ම දෙවියන්වහන්සේගේ පාලනය බලය යටතේ තිබෙන බව ඔබ හොඳාකාරව දන්නා නිසා කිසි විටක ඔබ කලබල නොවී ක්‍රියා කරනවා ඇත.

පරණ ගිවිසුම තුළ දෙවියන්වහන්සේගේ අභිමුඛත්වය තුල ජීවත් වී ආශිර්වාදය ලබාගත් පුද්ගලයින්ගේ ජීවිත ගැන බලමු.

ආබ්‍රහම්ගේ ජීවිතය තුළ දෙවියන්වහන්සේගේ අභිමුඛත්වය තිබුණි. අන්‍ය ජාතීන් පවා ඔහුගේ ජීවිතයෙහි තිබූ වෙනස අත් දුටුවේය. ***''ඒ කාලයෙහි අබිමෙලෙක් සහ ඔහුගේ සේනාපති වූ පීකොල් ආබ්‍රහම්ට කථාකොට : නුඹ කරන සියල්ලෙහිදී දෙවියන්වහන්සේ නුඹ සමඟය.'' (උත්පත්ති 21:22)*** එනම්, මේ රජතුමා පවසනු ලැබුයේ, ''ආබ්‍රහම් ඔබ තුළ යම්කිසි වෙනසක් තිබෙනවා. දෙවියන්වහන්සේ ඔබට මඟපෙන්වනවා. එම නිසා, ඔබ යන සෑම තැනකදීම ඔබ ආශිර්වාද ලබනවා.

දෙවියන්වහන්සේ පොරොන්දු වූයේ කිසිම සතුරෙක් නුඹට විරුද්ධව නැගී සිටින්නේ නැත යනුවෙනි. මන්ද දෙවියන්වහන්සේගේ අභිමුඛත්වය ඔහු හා සමඟ තිබුණේය. ***''නුඹේ ජීවිතයේ සියලු දවස් වල කිසිවෙකුට නුඹට විරුද්ධව සිටින්ට නොහැකි වන්නේය. මම මෝසෙස් සමඟ සිටියාක් මෙන්ම නුඹ සමඟත් සිටින්නෙමි. නුඹෙන් අහක්ව නොයන්නෙමි. නුඹ අත්නාරන්නෙමි. ශක්තිමත්ව ධෛර්‍යයමත්ව සිටපන්න. මක්නිසාද මේ සෙනඟට දෙන හැටියට මා විසින් ඔවුන්ගේ පියවරුන්ට දිවුල දේශය නුඹ ඔවුන්ට උරුමකරදෙන්නෙහිය.'' (යොෂුවා 1:5-6)*** දෙවියන්වහන්සේගේ ආත්මයානන්වහන්සේගේ අභිමුඛත්වය අප හා සමඟ තිබෙන කල්හි අපට ශක්තිමත්ව හා ධෛර්‍යයමත්ව සිටීමට හැකිය. මන්ද කිසිම සතුරෙකුට අපට හානියක් කිරීමට නොහැකිය.

දෙවියන්වහන්සේ ගිඩියොන්ට පවසනු ලැබුයේ , ***''....ධෛර්‍යයමත් බලවත් මනුෂ්‍යය, ස්වාමීන්වහන්සේ නුඹ සමඟ සිටිනසේක. නුඹේ මේ බලවත්කමින් ගොස් මිදියන්වරුන් අතින් ඉශ්‍රායෙල් ගලවාපන්න.'' (විනිශ්චයකාරයන්ගේ පොත 6:12-14)*** මෙහිදී දෙවියන්වහන්සේ පවසන්නේ කුමක්ද කියා ඔබට පැහැදිලි වෙනවාද? එනම්, 'ගිඩියොන්, නුඹ තුළ ඉතාම බලසම්පන්න දෙයක් තිබෙනවා. ඒ දෙයට පුලුවන් ඉශ්‍රායෙල් සෙනඟව, මුදවාගැනීමට. ඒ බලය තමයි මගේ අභිමුඛත්වය.' දේව වචනය තුළ ගිඩියොන් ඉතා භයව පුද්ගලයෙක්ය කියා පවසයි. නමුත් දේව වචනය තුළ දෙවියන්වහන්සේ ඔහුට පවසනු ලැබුයේ 'ඉතා බලවත් මනුෂ්‍ය' ය කියාය. දෙවියන්වහන්සේට අවශ්‍ය වූයේ ඔහු කොපමණ බලවත්

***4 වෙනි පිටුවට....***

පුද්ගලයෙක්ද කියා පෙන්වීමටය. ඔහු තුළ දෙවියන්වහන්සේගේ අභිමුඛත්වය තිබෙනවා නම්, ඔහු බලවත් පුද්ගලයෙක්ය කියා ඔප්පු කිරීමටයි.

යෙරෙමියාගේ අනාවැකිය නිසා මුළු ජාතියම ඔහුට විරුද්ධව නැගී සිටින්නේය කියාත් ඔහුගේ අනාවැකිය එපා කරන්නේය කියාත් දෙවියන්වහන්සේ ඔහුට අවවාද කළේය. එහෙත් දෙවියන්වහන්සේ ඔහුට මෙලෙස පොරොන්දු විය. ***"මම මේ සෙනඟට විරුද්ධව නුඹ බලවත් පිත්තල පවුරක් කරන්නෙමි, ඔව්හු නුඹට විරුද්ධව යුද්ධකරන්නෝය. නුමුත් නුඹෙන් ජය නොගන්නෝය. මක්නිසාද නුඹ ගලවන්ටත් නිදහස්කරන්ටත් මම නුඹ සමඟ සිටිමි." (යෙරෙමියා 15:20)*** දෙවියන්වහන්සේ ඔහුට පවසන්නේ, මුළු රටම නුඹට විරුද්ධව නැගී සිටියත් කිසිදු ප්‍රශ්නයක් නැත. මගේ අභිමුඛත්වය නුඹ සමඟ තිබෙන නිසා ධෛර්‍යයමත් වෙන්නය කියාය.

දෙවියන්වහන්සේ පවසනු ලැබුයේ, "භය නොවන්න" කියාය ***"…. භය නොවන්න, මක්නිසාද මම නුඹ මුදාගතිමි, නුඹේ නම කියා හඬගැසීමි. නුඹ මාගේය. නුඹ ජල මැදින් යන විට මම නුඹ සමඟ සිටින්නෙමි, නුඹ ගංගා මැදින් යන විට ඒවා නුඹට උඩින් ගලා යන්නේ නැත. නුඹ ගිනි මැදින් යන විට නොදැවෙන්නෙහිය. ගිනිදැල්ල නුඹ කෙරෙහි නොඇවිළෙන්නේය. මක්නිසාද මම නුඹේ දෙවිවූ ස්වාමීන්වහන්සේය. නුඹේ ගැලවුම්කාරයා වන ඉශ්‍රායෙල්ගේ ශුද්ධ තැනැත්තන්වහන්සේය, …. නුඹ මා ඉදිරියෙහි අනර්ඝව ගරුකටයුතුවූ බැවින්ද, නුඹ වෙනුවට මිනිසුන්ද නුඹේ ජීවිතය වෙනුවට ජනයන්ද, දෙන්නෙමි. භය නොවන්න, මක්නිසාද මම නුඹ සමඟ සිටිමි. නුඹේ වංශය නැගෙනහිරින් ගෙනෙන්නෙමි. බස්නාහිරින්ද නුඹ රැස්කරමි." (යෙසායා 43:1-5)*** එනම්, ස්වාමීන්වහන්සේ පවසන්නේ, මාගේ අභිමුඛත්වය නුඹ සමඟ තිබෙනවා නම්, ඔබට ඕනෑම ගින්නක් හා ජලධාරාවක් මැදින් කිසිදු විපතක් හෝ හානියක් නොවී යා හැකි බවයි. ඒ සියලු දේ තුළින්ම ඔබට ආශිර්වාදය ලැබේ. මන්ද මගේ අභිමුඛත්වය ඔබ හා සමඟ තිබෙන නිසාය.

පරණ ගිවිසුම තුළ ලියා ඇති කාරණාවන් කථාන්දර නොවේ. ඒවා ලියා තිබෙන්නේ අපව ධෛර්‍යයමත් කිරීමට හා දෙවියන්වහන්සේගේ අභිමුඛත්වය අපගේ ජීවිතයෙන් සොයන පිණිසය. ආබ්‍රහම්, යොෂුවා, ගිඩියොන්, යෙරමියා, යෙසායා හා සමස්ථ ඉශ්‍රායෙල් සෙනඟම දෙවියන්වහන්සේගේ අභිමුඛත්වය තුළ කුමක් කලේද? කියා අප දැනගෙන දෙවියන්වහන්සේට ස්තුති කිරීමට අපටද පුළුවනි. එමෙන්ම දෙවියන්වහන්සේගේ අභිමුඛත්වය කරණකොටගෙන අපගේ ජීවිත වල දෙවියන්වහන්සේ කලා වූ දේ පිළිබඳව අපටද සාක්ෂි තිබේ. මගේ ජීවිතය තුළ පවා මා දෙවියන්වන්සේගේ අභිමුඛත්වයේ අත්දැකීම තුලින් බොහෝ ආශ්චර්‍යමත් දේ අත්දැක තිබේ.

මගේ ජීවිතයේ කොතරම් බාධාවන් තිබුණත් ඒ සෑම දේ තුළින්ම ජයග්‍රාහීව ඉදිරියට යාමට දෙවියන්වහන්සේගේ කරුණාව ගෙන දුන්නේය.

මීට වසර 10 කට පෙර අපගේ සභාව ආරම්භ කල විට දෙවියන්වහන්සේගේ අභිමුඛත්වය අප කලාවූ සෑම දේ තුළම තිබුනේය. එම මෙම දේවස්ථානය ආරම්භ කිරීමට පෙර එහි තිබුනාවූ සිනමාහල ගැනීමට උත්සාහ දරූ අතර මා ඒ සම්බන්ධව රජයේ ලියකියවිලි සූදානම් කිරීමට ගිය විටදී බොහෝ අසීරුතා වලට මුහුණදීමට සිදුවිය. මා ඉහළ නිළධාරීන් හමුවීමට ගිය විටදී මා සිතුවේ ඔවුන්ව හමුවීමට මා හට නොහැකි බවයි. එහෙත් දෙවියන්වහන්සේගේ අභිමුඛත්වය මා සමඟ තිබූ නිසා එම නිළධාරියා තම කාර්‍යාලය ඇතුලට ගෙන ගියේය. ඊට සති කීපයක් ගෙවී ගිය වටිදී අප ඉතා හොඳ මිතුරන් බවට පත් විය. ඔහු මට පැවසූ දෙය නම්, 'මා දන්නේ නැහැ මම ඔබ සමඟ කොච්චර කාලයක් ගතකරනවාද කියා'. ඔහු නිතරම පවසන්නේ ඔහු ඉතා කාර්‍යය බහුලයි කියා. නමුත් මා එහි යන සෑම අවස්ථාවකදීම ඔහුගේ ලේකම්වරිය මා දුටු විට පූජකතුමනි ඔබ යන්නය ඔහු ඔබ එනතුරු බලාසිටිනවාය කියා මට ප්‍රමුඛස්ථානය දුන්නේය.

දෙවියන්වහන්සේ මනුෂ්‍යයන්ගේ හදවත් වෙනස්කරන බව අප දුටුවේය. අවසානයේදී අපට මෙම සිනමාහල ගැනීමට අවශ්‍ය ලියකියවිලි වලට ඔහු අත්සන් තැබීය. ඔහු එය අත්සන් තැබීය. ඔහු එය අත්සන් කරන විටදී පවසනු ලැබුයේ, 'මා මෙයට අත්සන් කරන්නේ ඇයි? කියා මා දන්නේ නැහැ' කියාය. නමුත් දෙවියන්වහන්සේගේ අභිමුඛත්වය මෙය කළ බව මා හොඳාකාරවම දනිමි. එමෙන්ම දෙවියන්වහන්සේ තවත් බොහෝ දෙනෙකුගේ හදවත් වෙනස් කලේය. තවද මෙම ගොඩනැගිල්ල ආසන්නයෙහිම පිහිටා තිබූ තවත් කොටසක් අප ගැනීමට සූදානම් වන විටදීද අපට තවත් බාධාවන් පැමිණුනේය. නමුත් අවසානයේදී අපට එය ලබා ගැනීමටද හැකි විය. එහි අයිතිකරු එම කොටස විකුණන විටදී මා හට පවසනු ලැබුයේ, "කිසියම් කෙනෙක් ඉහළ සිට ඔබට උපකාර කරනවාය" කියාය.

එය දෙවියන්වහන්සේගේ අභිමුඛත්වයේ බලයයි. අපට සැබවින්ම කීමට හැකි දෙය නම් දෙවියන්වහන්සේගේ අභිමුඛත්වය අපට මහත් වූ දේ කර ඇති බවයි.

**දෙවියන්වහන්සේගේ අභිමුඛත්වයේ බලය අපගේ ජීවිතය තුළ ක්‍රියාත්මක වීමට කොන්දේසි තිබේ.**

දෙවියන්වහන්සේගේ අණ ක්‍රියාත්මක වන පිණිස අපගේ ජීවිතයට කොන්දේසි දමා තිබේ. 2 ලේකම් 15 වන පරිච්ඡේදය තුළින් අපට මේ ගැන දැනගැනීමට පුළුවනි. මීට පෙර පරිච්ඡේදයෙහි ආසා රජතුමා යුදාහි රජතුමා සමඟ එතියෝපියේ ලක්ෂ දහයක හමුදාවක් සමඟ ජයගත් බවට සඳහන්ය. එහෙත් ආසා දෙවියන්වහන්සේගේ අභිමුඛත්වය තුළ සතුරාව පරාජයට පත් කළ බවට සාක්ෂි දැරුවේය.

***"ආසා තමාගේ දෙවිවූ ස්වාමීන්වහන්සේට යාච්ඤා කොට ස්වාමීන්වහන්සේ බලසම්පන්න අයත් බෙලහීන අයත් අතරේ පිහිටවෙන්ට ඔබ හැර කිසිවෙක් නැත්තේය. අපේ දෙවිවූ ස්වාමීන්වහන්ස අපට පිහිටවුවමැනව, මක්නිසාද අප ඔබ කෙරේ විශ්වාසය තබා, ඔබගේ නාමයෙන් මේ සමූහයාට විරුද්ධව සිටිමුව. ස්වාමීන්වහන්ස ඔබ අපේ දෙවියන්වහන්සේය. ඔබට විරුද්ධව මනුෂ්‍යයා ජය නොගනීවයි කීවේය. ස්වාමීන්වහන්ස ආසා සහ යුදාවරුන් ඉදිරියෙහි කූෂ්වරුන් පැරදවූ සේක. කූස්වරු පලාගියෝය." (2 ලේකම් 14:11-12)***

*6 වෙනි පිටුවෙන්….*

GREAT COMMISSION PARTNERS
ECHO OF HIS CALL MINISTRIES
SINCE 1969

# යාච්ඤා පංගුකාර සේවයේ අයට යාච්ඤා ඉල්ලීම්

**බෙදා ගැනීම (ගලාති 6:2)**
**උපකාර කිරීම (රෝම 12:13) සහ**
**පුබුදු කිරීම (2 තිමෝති 1:6)**

## ස්තුති දීම හා ප්‍රසංශා කල යුතු කරුණු

**මාර් : 19-** නවක ඇදහිලිවතුන් ගැන ස්තුති කරන්න.

**මාර් : 20-** කිතුණු දේව සේවකයන් ගැන ස්තුති කරන්න.

**මාර් : 21-** මත්පැන් හා මත්ද්‍රව්‍ය පාවිච්චි කිරීමෙන් නිදහස් වී ගැලවීම ලබාගත් අය ගැන ස්තුති කරන්න.

**මාර් : 22-** භාෂා 16 කින් මුද්‍රනය වන 'කැඳවීමේ ප්‍රතිරාවය' පුවත් පත් සේවය ගැන ස්තුති කරන්න.

**මාර් : 23-** ගැලවීම ලබා ගත් අයට සත්‍ය දේව වචනය ඉගෙනීමට ආශිර්වාද කරමින් ස්තුති කරන්න.

**මාර් : 24-** කිතුණු කාන්තා හා පුරුෂ සේවාවන්වල වර්ධනය ගැන ස්තුති කරන්න.

**මාර් : 25-** දේව සේවය උදෙසා දෙවිඳුන් සපයන ආකාරය ගැන ස්තුති කරන්න.

**මාර් : 26-** මිශනාරීවරුන්ගේ සේවය ගැන ස්තුති කරන්න.

**මාර්: 27-** කිතුණු දේව ධර්ම පාඨමාලාවන් ගැන ස්තුති කරන්න.

**මාර් : 28-** යාච්ඤාවෙන් සහ උපකාර කිරීමෙන් දේව සේවයන් වලට සහාය වන අප ගැන ස්තුති කරන්න.

**මාර් : 29-** බයිබල් විදුහල්වල සිසු සිසුවියන්ගේ ප්‍රමාණවත් අධ්‍යාපන කටයුතු ගැන ස්තුති කරන්න.

**මාර් : 30-** රජය සමඟ එකතුව අධ්‍යාපන කටයුතු වලට උපකාර කරන කිතුණු පාසල් ගැන ස්තුති කරන්න.

**මාර් : 31-** කැඳවීමේ ප්‍රතිරාවය සේවයේ සෑම සේවකයකු ගැනම ස්තුති කරන්න.

### 2020 අප්‍රේල් මාසය

**අප්‍රේ :** මාර්තු මාසය පුරා අපට ආශිර්වාද කළ දෙවිඳුන්ට ස්තුති කරන්න.

**අප්‍රේ : 02-** අධිකරණය සහ පොලීසිය තුළ සේවය කරන සෑම අයෙක් ගැන ස්තුති කරන්න.

**අප්‍රේ : 03-** පාලක සෑම් සෙල්වරාජ් ඇතුලු පවුලේ සැවොම ගැන ස්තුති කරන්න.

## යාච්ඤා කිරීම් සඳහා කරුණු

**අප්‍රේ : 04-** ''කැඳවීමේ ප්‍රතිරාවය'' පුවත් පත් සේවයට මෙම මාසයේ මූල්‍යමය පහසුකම් ගැන යාච්ඤා කරන්න.

**අප්‍රේ : 05-** බොහෝ දිළිඳුකමින් ජීවත් වන අය උදෙසා යාච්ඤා කරන්න.

**අප්‍රේ : 06-** ශ්‍රී ලංකාව තුළ සිදු කරන තැපැල් මාර්ගික කිතුණු පාඩම් මාලා වල වර්ධනය ගැන යාච්ඤා කරන්න.

**අප්‍රේ : 07-** සෑම දුෂ්කර ස්ථානයක සේවය කරන දේව සේවකයන් ගැන යාච්ඤා කරන්න.

**අප්‍රේ : 08-** ඉශ්‍රායෙලයේ සමාදානය උදෙසා යාච්ඤා කරන්න.

**අප්‍රේ : 09-** ත්‍රස්තවාදීන්ගේ ගැලවීම උදෙසා යාච්ඤා කරන්න.

**අප්‍රේ : 10-** ව්‍යාජ කිතුණු දේව ධර්මයන් නිසා සිදුවන හානිය ගැන යාච්ඤා කරන්න.

**අප්‍රේ : 11-** අප දේශයට ව්‍යාජ කිතුණු ධර්ම රැගෙන එය අයගේ ගමන් වලක්වන ලෙස යාච්ඤා කරන්න.

**අප්‍රේ : 12-** ව්‍යාජ කිතුණු ධර්ම පැතිරවීමට උපකාර කරන දේශීය සභා පාලකවරුන් ගැන යාච්ඤා කරන්න.

**අප්‍රේ : 13-** දේශයේ සිටින ඉතා බලවත් ව්‍යාජ කිතුනු නිකායන් වන ''යෙහෝවා සාක්ෂිකරුවන්'' ගැන දෙවිඳුන්ට යාච්ඤා කරන්න.

**අප්‍රේ : 14-** ඇමරිකා මහද්වීපය කිතුණු ව්‍යාජ ධර්ම වල මූලස්ථානය බවට පත් වී ඇත. ඒ ගැන යාච්ඤා කරන්න.

**අප්‍රේ : 15-** රැකියා විරහිත සෑම අයෙකුටම සුදුසු රැකියාවක් ලැබෙන ලෙස යාච්ඤා කරන්න.

**අප්‍රේ : 16-** ක්‍රිස්තුස්වහන්සේගේ දෙවන ඊමට සෑම කිතුණුවෙකුම නිතරම සූදානම්ව සිටින පිණිස යාච්ඤා කරන්න.

**අප්‍රේ : 17-** අපට විරුද්ධව වැරදි කළ අයට සමාව දී යාච්ඤා කරන්න.

**අප්‍රේ : 18-** සමාව දුන් සෑම කරුණක්ම අමතක කිරීමට ශුද්ධාත්ම බලය ඉල්ලා යාච්ඤා කරන්න.

4 වෙනි පිටුවෙන්....

***''ඔහු ආසාගේ පෙරමගට ගොස් කථාකොට ආසා සහ සියලු යුදාවරුනි, බෙන්'යමින්'වරුනි මට ඇහුම්කන්දියල්ලා, නුඹලා ස්වාමීන්වහන්ස සමඟ සිටින තුරු උන්වහන්ස නුඹලා සමඟ සිටින සේක. නුඹලා උන්වහන්සේව සොයනවා නම් උන්වහන්සේ නුඹලාට සම්බවෙනවා ඇත. නුඹලා උන්වහන්සේ අත් හැරියොත් උන්වහන්සේ නුඹලා අත්හරිනවා ඇත. බොහෝ කාලයක සිට ඉශ්‍රායෙල්වරු සැබෑවූ දෙවියන්වහන්සේවද උගන්වන පූජකයෙක්ද ව්‍යවස්ථාවද නැතුව සිටියෝය. නුමුත් ඔවුන් තමුන්ගේ විපතේදී ඉශ්‍රායෙල්ගේ දෙවිවූ ස්වාමීන්වහන්සේ වෙතට හැරී උන්වහන්සේ සෙවූ කළ උන්වහන්සේ ඔවුනට සම්බවූ සේක.''*** *(2 ලේකම් 15:2-4)*

අපගේ ජීවිතයද දෙවියන්වහන්සේගේ අභිමුඛයෙහි රඳා පවත්වාගැනීමේ රහස නම් මෙයයි. එනම්, දෙවියන්වහන්සේ ආසාට මතක් කර දෙනවා, 'නුඹ මෙය ජයගත්තේ කෙසේද කියන එක අමතක නොකරන්න. නුඹගේ මුළු හදවතින්ම නුඹ මාව සෙව්වා. ඔබ කරදරයේ සිටින විටදී මුළු හදවතින්ම මගේ පිහිට පැතුවා. මගේ අභිමුඛත්වය මා ඔබ වෙතට එව්වා. මාගේ අභිමුඛත්වයයි, නුඹේ සතුරාව පරාජයට පත් කළේ' යනුවෙනි.

දැන් අසිරියා රජතුමා ආසාට මෙසේ පවසයි. ''ඔබ රජකමට පැමිණි විට ඔබ දන්නවා ඔබ සිටි තත්වය. මේ රට තුළ කිසිම නීතියක් තිබුණේ නැහැ. ධර්මිෂ්ඨවූ නීතියක් තිබුනේ නැහැ. අද තමාට ඕන දේ කරයි.

අද කිතුණු ජීවිත වලද මෙම තත්වයම දක්නට ලැබේ. සෑම දේම අපිළිවෙලට කරයි. අසමාදානය ඇත. එකිනෙකා තමාට ඕනදේ පමණක් කරන්නේය. බොහෝ පවුල් අද විනාශ වී තිබේ. කිසිම පවුලක් අද මේ තත්වයෙන් සිටිය යුතු නැත.

දෙවියන්වහන්සේගේ පොරොන්දු කිසිවක් වෙනස්වී නැත. ඔබගේ මුළු ජීවිතකාලය පුරාවටම ඔබ ස්වාමීන්වහන්සේ සමඟ ගමන්කරනවා නම්, ''මම නුඹ සමඟ සිට නුඹ මට කන්නලව් කරන විටදී මම නුඹට පිළිතුරු දෙමියි' කියා උන්වහන්සේ පවසයි.

නිවසක ස්වාමි පුරුෂයා හා භාර්යාව වශයෙන් ඔබ දෙවියන්වහන්සේව සොයනවා නම්, උන්වහන්සේගේ අභිමුඛත්වය තුළ සිටිනවා නම්, ඔබගේ සියලු දේම සුභසිද්ධ වෙනු ඇත.

***''....මට ඇහුම්කන්' දියල්'ලා.... නුඹලා උන්වහන්සේව සොයනවා නම්, උන්වහන්සේව නුඹලාට සම්භ වෙන්වා ඇත.*** *(2 ලේකම් 15:2)* දෙවියන්වහන්සේගේ අභිමුඛත්වය අප වෙතට එන්නේ අපට ආශිර්වාද කිරීමටය. ඔබගේ මුළු හදවතින්ම ස්වාමීන්වහන්සේව සොයන්න. උන්වහන්සේ ඔබ වෙතට එන සේක. ඒ අභිමුඛත්වය ඔබ සමඟ තිබෙන්නේය. ඒ අභිමුඛත්වයෙහි තිබෙන දිව්‍යමය බලය ඔබගේ මුළු ජීවිතයටම බලවත් ආශිර්වාදයක් වන සේක.

**අපගේ මුළු ජීවිතයෙන්ම දෙවියන්වහන්සේව සොයනවා නම්, උන්වහන්සේගේ අභිමුඛත්වය අප සමඟ තිබෙනු ඇත.**

සෑම ඇදහිලිවන්තයෙකු සමඟම උන්වහන්සේ තමාගේ ගිවිසුම ඇතිකර ගන්නේය. එම ගිවිසුමේ පොරොන්දුව නම්, දෙවියන්වහන්සේ අපගේ සියලුම අයුතුකම් ක්‍රිස්තුස්වහන්සේ මත තැබීය, යේසුස්වහන්සේ අප වෙනුවෙන් ශාපයක් විය. උන්වහන්සේ කිසි කලෙක අපව අතහරින්නේවත් අමතක කරන්නේවත් නැත.

තමාගේ මුළු හදවතින්ම දෙවියන්වහන්සේව සොයන්නාවූ අයට උන්වහන්සේ විශේෂ පොරොන්දුවක් දෙයි. එනම්, දෙවියන්වහන්සේගේ අභිමුඛත්වයේ ගිවිසුමයි. අප උන්වහන්සේගේ අභිමුඛත්වයේ නීතිරීති වලට යටත්වෙනවා නම්, උන්වහන්සේගේ ආශ්චර්යමත් දේව අභිමුඛත්වයේ ආශිර්වාදය අපගේ ජීවිතවල භුක්ති විඳිමු. දෙවියන්වහන්සේ උන්වහන්සේගේ අභිමුඛත්වයේ ගිවිසුම එළිදරව් කරනවා නම්, හෙසකියා අනාගතවක්තෘගේ පරාජය තුළිනි. මේ අනාගතවක්තෘ ඒ කාලයේ සිටි උත්තම පූජකයා ඒලිට කථා කලේය. එවිට ඒලි පසුබට වී සිටියාය. දෙවියන්වහන්සේ ඔහුට කථා කර අවවාදයක් දුන්නේය. නමුත් ඒලි දෙවියන්වහන්සේගේ වචනය අහකට දැමීය. දැන් මෙම අනාගතවක්තෘ ඒලිට කථාකර මෙසේ පැවසීය. ***'‘එබැවින් ඉශ්‍රායෙල්ගේ දෙවිවූ ස්වාමීන්වහන්සේ මෙසේ කියනසේක. නුඹේ වංශයෙන් නුඹේ පියාගේ වංශයෙන් සෑම කල්හිම මා ඉදිරියෙහි හැසිරෙනවා ඇතැයි සැබවින්ම කීවෙමි. නුමුත් දැන් ස්වාමීන්වහන්සේ කියන්නේ නම්, එය මාගෙන් දුරුවේවා කියාය. මක්නිසාද මට ගෞරවකරන්නන්ට මටත් ගෞරව කරමි. මා සුළුකොට සිතන්නෝ නීච කොට සලකනු ලබති.''*** *(1 සාමුවෙල් 2:30)*

දෙවියන්වහන්සේ ඒලිගේ පවුලෙන් උන්වහන්සේගේ අභිමුඛත්වය අහක්කලේය. මන්ද ඒලි ඒ කාලය තුළ සිදුවූ පාපයට විරුද්ධව අවවාද නොදී ඒ පිළිබඳව නොසැලිකිලිමත්ව සිටියේය. ඔහු ඔහුගේම මාංෂයේ බලයෙන් ක්‍රියා කළ නිසා දෙවියන්වහන්සේගේ අභිමුඛත්වය ඔහු තුළින් ඉවත් කිරීමට උන්වහන්සේට සිදු විය.

බොහෝ දෙනා දෙවියන්වහන්සේ වෙතට පැමිණෙන්නේ මහත් ජ්වලිතකමකින් හා උනන්දුවක් ඇතිවය. නමුත් කාලයක් ගතවන විටදී ඔවුන් සීතල තත්වයට පත් වෙති. ඔවුන්ගේ පාපිෂ්ඨ වූ මාර්ගයෙන් හැරෙන්නය කියා දෙවියන්වහන්සේ පවසයි. ඔවුන් සමඟ දේව අභිමුඛය තිබෙනවාය කියා ඔවුන් සිතති. නමුත් දේව වචනයෙහි පවසනුයේ, ''ඔබ දෙවියන්වහන්සේව අමතක කලහොත් උන්වහන්සේ ඔබවද අමතක කරයි. ඔබ උන්වහන්සේව නොසෙව්වොත් උන්වහන්සේ ඔබගෙන් ඈත්වෙයි.'' යනුවෙනි.

දෙවියන්වහන්සේගේ පොරොන්දු කිසිකලෙකත් වෙනස් වන්නේ නැත. නමුත් අප පාපය තුළ දිගටම ජීවත් වන්නේ නම්, උන්වහන්සේගේ අභිමුඛය දිගටම අප සමඟ ගමන්කරන්නේ නැත. තවදුරටත් දෙවියන්වහන්සේගේ අභිමුඛය අප සමඟ තිබෙන්නේ නැත. අභිමුඛත්වයේ බලය අප සමඟ ක්‍රියා කරන්නේද නැත.

**දේව අභිමුඛත්වය අප තුළ තිබෙන කල්හි අපට උන්වහන්සේගේ මහිමය දැකීමට හා තේරුම්ගැනීමට හැකිය.**

ඉශ්‍රායෙල් සෙනඟ කාන්තාරයෙහි සිටි කල්හි දෙවියන්වහන්සේගේ අභිමුඛත්වය වළාකුල තුළින් උන්වහන්සේ එළිදරව් කලේය. දෙවියන්වහන්සේගේ සෙනඟ සමඟ

උන්වහන්සේගේ අභිමුඛත්වය තිබෙන බවට උන්වහන්සේ විසින් ඔවුන්ට දෙන ලද්දාවූ සහතිකය ලෙස මෙම ශාරීරික අඩයාලම දැක්විය හැකිය. දෙවියන්වහන්සේගේ කූඩාරම, රෑ දවල් දෙකෙහිම මෙම වලාකුල තේජාන්විතව වැළඳගත්තේය. මෙය ඔවුන්ගේ ගමනට මඟපෙන්වමින් එනම්, වලාකුල ගමන්කරන විට ඔවුන්ද ගමන්කළ අතර වලාකුල නතර වූ කල්හි ඔවුන්ද එහි නතර විය. ඔවුන්ගේ ගමන ගැන සාකච්ඡා කරමින් මාර්ගය සොයා ගැනීමට අවශ්‍යය වූයේ නැත. මන්ද ඔවුන්ගේ ගමනට මඟපෙන්වීම තිබෙන බව ඔවුන් ස්ථිර ලෙසම දැන සිටියේය.

අදත් දෙවියන්වහන්සේගේ අභිමුඛත්වය නැමති මෙම වලාකුල අපගේ යාච්ඤාව කරණකොටගෙන අප සමඟ තිබෙන්නේය. එම අභිමුඛත්වය ඔබට මගපෙන්වයි. ඔබට සමාදානය ගෙන දෙයි. ඔබගේ ජීවිතයට පැහැදිලි මගපෙන්වීමක් ගෙන දෙයි.

ඔබ දෙවියන්වහන්සේ සමඟ ඉතා සමීපව සිටිනවා නම් ඔබ ගමන්කරන කල්හී, ඔබගේ රැකියාවෙහි ඔබ නියුතුවන ස්ථානයේදී ඔබ ඕනෑම ක්‍රියාවක් කරන විටදී ස්වාමීන්වහන්සේගේ අභිමුඛත්වය ඔබට මගපෙන්වනවා ඇත. දෙවියන්වහන්සේ සමඟ නොකඩවා පවත්වන යාච්ඤා ජීවිතය ඉතා වටින්නේය.

ඔබ උන්වහන්සේ සොයන්නාවූ යාච්ඤා කරන්නාවූ කෙනෙක් නම් උන්වහන්සේගේ අභිමුඛත්වය තුළ වසා තිබෙන සියලු දොරවල් ඇර ඔබව සම්පූර්ණයෙන්ම රැකබලා ගන්නේය. එපමනක්ද නොව ඒ අභිමුඛත්වයේ තේජසද ඔබට එළිදරව් කරනු ඇත.

බොහෝ කිතුණුවන් දෙවියන්වහන්සේගේ අභිමුඛත්වය හඳුනති. නමුත් උන්වහන්සේගේ තේජස හඳුනන්නේ ඉතා සුළු පිරිසක් පමණි. දෙවියන්වහන්සේගේ අභිමුඛයටත් තේජසටත් තිබෙන වෙනස මෙසේ ප්‍රකාශ කරයි. ***''එවිට වලාකුල සම්මුඛවීමේ කූඩාරම වසාගත්තේය. ස්වාමීන්වහන්සේගේ තේජසෙන් මණ්ඩපය පිරීගියේය.'' (නික්මයාම 40:34)***

පාවුලු තුමා මෙසේ ලියනු ලබයි. ''සෑම ඇදහිලිවන්තයෙකුගේම ශරීරය දෙවියන්වහන්සේගේ මාළිගය බවයි. ***''නුඹලා දෙවියන්වහන්සේ ගේ මාලිගාව බවද දෙවියන්වහන්සේගේ ආත්මයාණන්වහන්සේ නුඹලා තුළ වාසය කරන බවද නොදනිවුද ?'' (1 කොරින්ති 3:16)*** ඉශ්‍රායෙල් සෙනඟ දෙවියන්වහන්සේගේ අභිමුඛත්වය නැමති වලාකුල යට සිටියාක් මෙන් අපද දෙවියන්වහන්සේගේ කරුණාව යටතේ ජීවත් වෙයි. එහෙත් උන්වහන්සේගේ අභිමුඛයටත් උන්වහන්සේගේ මහිමයටත් අතර ඇති වෙනස කුමක්ද?

**දෙවියන්වහන්සේ මෝසෙස්ට උන්වහන්සේගේ මහිමයේ එළිදරව්ව දුන් සේක.**

දෙවියන්වහන්සේගේ අභිමුඛත්වය දිගටම ඔවුන් සමඟ තිබිය යුතුයි කියා ඔවුන් පැවසුවේය. ***''....මා විසින් ඔබ හැඳිනගන්නා පිණිස....'' (නික්මයාම 33:13-14)*** මෝසෙස්ගේ මෙම ඉල්ලීම මෙන් අදත් අප සියල්ලෝම මගපෙන්වන පිණිස උන්වහන්සේගේ අභිමුඛත්වය අවශ්‍යය වේ. තවද මෙම අභිමුඛත්වයට දෙවියන්වහන්සේගේ ආශිර්වාදය අවශ්‍යය වේ.

එහෙත් මෝසෙස්ට දෙවියන්වහන්සේගේ අභිමුඛත්වය පමණක් සෑහුනේ නැත. මන්ද ඊට වඩා වැඩි දෙයක් තිබෙන බව ඔහු දැනගෙන සිටියේය. ඒ උදෙසා ඔහු දිගටම මොරගැසුවේය. ***''....අනේ ඔබගේ තේජස මට පෙන්නුව මැනව....'' (නික්මයාම 33:18)***

දෙවියන්වහන්සේ මෝසෙස්ට උන්වහන්සේගේ තේජස ඉතා සරළ ආකාරයෙන් පෙන්නුම් කළේය.

***''ස්වාමීන්වහන්සේ ඔහු ඉදිරිපිටින් වඩිමින්, ස්වාමීන්වහන්ස, උන්වහන්සේ අනුකම්පාවෙන් පූර්ණවූ දයාවන්තවූ උදහස්වීමට ප්‍රමාද වන්නාවූ අධිකතර කරුණාව සහ සැබෑකමද ඇත්තාවූ දෙවි කෙනෙක්ය. උන්වහන්සේ දහස් ගණනකට කරුණාව පවත්වනසේක. අයුතුකමත් අපරාධයත් පාපයත් ක්ෂමාකරනසේක. වරදකරුවන් කවර ප්‍රකාරයකින්වත් නිදහස් නොකරනසේක. තුන්වෙනි සතරවෙනි පරම්පරාව දක්වා දරුවන්ටත් දරුවන්ගේ පියවරුන්ගේ අධර්මිශ්ඨකම ගැන ප්‍රතිඵල දෙන සේක.'' (නික්මයාම 34:6-7) දෙවියන්වහන්සේගේ තේජස, උන්වහන්සේගේ යහපත්කම, කරුණාව, ප්‍රේමය හා අනුකම්පාවේ එළිදරව්වක්ය.***


**ඔබගේ කරුණාවන්ත අවධානය සඳහා**

**කැඳවීමේ ප්‍රතිරාවය** තුළින් සිදුවන විවිධාකාර සේවයන්, දෙවියන්වහන්සේගේ සේවයන් යයි ඔබ විශ්වාස කරනවාද?........................

කුමන ආකාරයකින් හෝ, **කැඳවීමේ ප්‍රතිරාවය** හි සේවයන්ට දායක වීමට ඔබ කැමති වන්නේද? ............................................................................

ඔබගේ මහත් සැලකිලිවන්ත යාච්ඤා තුළින් මෙම සේවයන් ඉදිරියේ **යාච්ඤා හවුල්කරුවකු** වීමට ඔබත් කැමතිද?............................

,**කැඳවීමේ ප්‍රතිරාවය,** සේවයන් හමුවේ, කුඩා මාසික දීමනාවකින් (මාස 12) ඇදහිල්ලේ පංගුකාරයකු වීමට, ඔබ අදහස් කරන්නේද?

....................................................................................................................................................................................

කරුණාකර අපට ලියන්න.



**ECHO OF HIS CALL,**

10, Mohammed Abdullah II Street, Chepauk, Chennai - 600 005, India.

Ph.: (+91-44) 2852 8282, 2852 9293, 2854 7766 Cell: (+91) 98410 71852.

**E-mail: sam@echoofhiscall.org / biblecor@yahoo.co.in Websites: www.echoofhiscall.org / www.echoofhiscall.com**

බොහෝ කිතුණුවන් මේ ආකාරයෙන් පවසනු ලබයි. 'දෙවියන්වහන්සේගේ තේජස ඊයේ රාත්‍රියේදීත් අපගේ සභාව තුළට පැමිණි අතර මනුෂ්‍යයන්, ආත්මයෙන් පිරී බිම වැටුනේය.' නමුත් දෙවියන්වහන්සේගේ තේජස මෙය නොවෙයි. දෙවියන්වහන්සේගේ තේජස ඔප්පු කිරීමට ඇති ලකුණ එයින් දෙවියන්වහන්සේ එළිදරව් කරන්නේ නැත.

යේසුස්වහන්සේගේ ගෝලයින් එදා කන්දේදී අත්දැක්ක අන් වෙසක්වීම උන්වහන්සේගේ තේජස නොවේද කියා සමහරු පවසයි. නමුත් දෙවියන්වහන්සේගේ තේජස මෝසෙස් හා එළියා තුළ තිබුනේ නැත. නමුත් උන්වහන්සේගේ තේජස තිබුණේ යේසුස්වහන්සේ තුළයි. ''***....උන්වහන්සේගේ මුහුණ සූර්‍යයා මෙන් බැබළුවේය. උන්වහන්සේගේ වස්ත්‍රද ආලෝකය මෙන් සුදු වූයේය....මේ මාගේ ප්‍රේමවන්ත පුත්‍රයාය. මොහු කෙරෙහි ඉතා ප්‍රසන්නව සිටිමි, මොහුට ඇහුම්කන්දෙමියයි වලාපටලයෙන් හඬක් විය.'' (මතෙව් 17:2-5)***

දෙවියන්වහන්සේ පවසන්නේ ක්‍රිස්තුස්වහන්සේ තුළ මෙයයි. මාගේ තේජස යනුවෙනි. ක්‍රිස්තුස්වහන්සේ කරුණාවන්තයි. දයාවන්තයි. ඉවසිලිවන්තයි. යහපත්කමෙන් පූර්ණයි. සත්‍යවාදීයි. අයුතුකමට කමාව දෙයි. පාපවලට කමාව දෙයි. මේ ගති ලක්ෂණ අප තුළ තිබෙනවා නම්, උන්වහන්සේගේ තේජස අප තුළ ක්‍රියාකරනවා හා සමානයි.

සමහරු නිරය ගැන දර්ශන දකී. ඉන්පසු ඔවුන් අප ජීවත්වන්නේ උන්වහන්සේ සමඟයි කියා පවසති. පසුව එය අමතක කර දමති. නමුත් ඔබට දෙවියන්වහන්සේ ගැන හා උන්වහන්සේගේ තේජස ගැන එළිදරව්වක් තිබේ නම්, උන්වහන්සේගේ තේජසත් කරුණාවත් හා දයාවත් තුළින් අපව ශුද්ධකමින් තබා ගනී.

අපගේ ඇස් විවෘත කරනවාට දෙවියන්වහන්සේ කැමතියි. ''***....ශුද්ධවන්තයන් තුළවූ උන්වහන්සේගේ උරුමයේ මහිමයේ සම්පත කිමෙක්ද කියා'' (එපීස 1:18) ''මක්නිසාද උන්වහන්සේ තුළ දේවත්වයේ සියලු සම්පූර්ණකම ශරීරාකාරයෙන් වාසයකරන්නේය.'' (කොලොස්සි 2:9)***

මෝසෙස් ඉතා ඕනෑකමින් දෙවියන්වහන්සේගේ තේජස දකින්න ඕනය කියා පැවසුවේ ඇයි? මා විශ්වාස කරනවා මේ පදය තුළින් මෙයට පිළිතුරක් තිබේය කියා. ''***එහිදී මම ඉශ්‍රායෙල් පුත්‍රයන්ට සම්මුඛ වන්නෙමි, මාගේ මහිමයෙන් කූඩාරම විශුද්ධ කරනු ලබන්නේය.'' (නික්මයාම 29:43)*** එනම්, දෙවියන්වහන්සේ මෝසෙස්ට පවසනු ලැබුයේ, 'මෝසෙස් ඔබත් ඉශ්‍රායෙල් සෙනඟත් මට නමස්කාර කරන කල්හි මා ඔබ වෙතට පැමිණ මගේ අභිමුඛත්වය ඔබට දෙමි. මගේ තේජසේ අභිමුඛය ඔබට ලැබෙන විට ඔබ පවිත්‍රවන්නේය. දෙවියන්වහන්සේ අපට පවසන්නේ, 'ඔබගේ මාළිගාව මගේ තේජසේ එළිදරව්ව කරණකොටගෙන පවිත්‍රවෙයි. එනම්, එම එළිදරව්ව මාගේ පුත්‍රවූ යේසුස් ක්‍රිස්තුස්වහන්සේ තුළින් දැනටමත් එළිදරව් වී තිබේ.

දෙවියන්වහන්සේ තුළින් මේ එළිදරව්ව අප ලබා ගන්නේ කෙසේද? අපට මේ එළිදරව්ව ලබා ගැනීමට හැක්කේ දේව වචනය තුළින්ය. ශුද්ධවූ පාවුළුතුමා පවසන ආකාරයට 'දෙවියන්වහන්සේගේ වචනය අප අපගේ ජීවිතයට අදාල කරගත් විට ක්‍රිස්තුස්වහන්සේගේ එළිදරව්ව අපට ලැබෙන බවයි. ''***අපි සියල්ලෝද මුහුණ වැස්මක් නැතිව, ස්වාමීන්වහන්සේගේ තේජස කැඩපතකින් මෙන් දක්වමින්, ආත්මයාණන්වහන්සේ වන ස්වාමීන්වහන්සේ කෙරෙන් තේජසින් තේජසට එම ස්වරූපයට වෙනස්කරනු ලබමුව.'' (2 කොරින්ති 3:18)***

දෙවියන්වහන්සේගේ තේජසේ එළිදරව්ව අපගේ ජීවිතයට බලය දෙයි. ''***....මක්නිසාද මුළු තේජස පිට ඉහළින් වියනක් වන්නේය.'' (යෙසායා 4:5)*** ඉතා අසීරු අවස්ථාවන් වලදී පවා දෙවියන්වහන්සේගේ මහිමය අපව පවිත්‍රව තබා ගනී. යක්ෂයා අපිව සෝදිසි කිරීමට පුළුවනි. නමුත් අපට මෙසේ පැවසීමට හැකියාව තිබිය යුතුය. එනම්, ''යක්ෂයා මට ප්‍රධාන උත්තම පූජකයෙක් සිටියි. දෙවියන්වහන්සේගේ තේජසේ එළිදරව්ව කරණකොටගෙන මා පවිත්‍ර වී සිටිමි.'' යනුවෙනි.


# ECHO OF HIS CALL

**Monthly magazines in 16 languages, Bible Colleges, Postal Courses, Church Planting, Village English High School, Gospel Printing Press, Crusades, Seminars, Social Services, etc.**

**Annual Subscription : Rs. 100/-** **Life Subscription : Rs. 2000/-**

The multifarious activities of **Echo of His Call Ministry** is supported by the free-will offerings and donations of the God's children like you. You may support **Echo of His Call** and its activities as the Lord leads you. We need your help to send forth the Gospel to the unreached people and plant Churches.

If you would like to receive **ECHO OF HIS CALL** magazines regularly, please write to us. Whenever you change your postal or e-mail addresses, please do inform us your old and new addresses.

**Echo of His Call** is available in 16 languages in our websites also. You can read it by going into the site as well as downloading it and get blessed.

Your letters, prayer requests and your financial helps (by D.D., Cheque, M.O. etc.) to **ECHO OF HIS CALL** may be sent to the address below.

Please send your **Land Phone / Cell Phone Numbers and E.mail addresses** for updation.



**ECHO OF HIS CALL**

10, Mohammed Abdullah 2nd Street, Chepauk, Chennai - 600 005, India.

Phone : (+91- 44) 2852 8282, 2852 9293, 2854 7766 Cell : (+91) 98410 71852

E-mails : sam@echoofhiscall.org / biblecor@yahoo.co.in Websites : www.echoofhiscall.org / www.echoofhiscall.com



# PIT TO PALACE
## පාලු වලකින් මාලිගාවට
## “...කියවන්නා තේරුම් ගනීවා....” (මතෙව් 24:15)

**“නමුත් මම දුප්පත්මි, දිළින්දෙමි, එහෙත් ස්වාමීන්වහන්සේ මා සිහිකරනසේක...”**

**(ගීතාවලිය 40:17)**

මීට වසර 46කට පෙර චෙන්නෙයි නුවර විශාල පිබිදීමේ රැස්වීමක් තිබුණි. එම රැස්වීම සඳහා දකුණු අප්‍රිකාවේ සිට විශේෂ දේවදාසයෙක් පැමිණියේය. දෙවියන්වහන්සේ එම රැස්වීමේදී බොහෝ හාස්කම් කලේය. දහස් ගණන් සෙනග සුවය අත්දැක්කේය. බොහෝ හාස්කම් සිදුවිය. මා එම රැස්වීමේ ස්වේච්ඡා සේවකයෙකු ලෙස සේවය කළෙමි.

අවසාන දින රැස්වීම නිමාවූ පසුව හැම ආරාධිත අමුත්තන්ම, සේවකයින් හා උදවු උපකාර කළාවූ සියලු දෙනාටම රැස්වීමක් පැවැත්විය. එම රැස්වීමේදී දකුණු අප්‍රිකාවේ සිට පැමිණි දේශකතුමා ඒ වේලාවේදී මට ඉදිරියට පැමිණෙන්නය කියා මා ගැන තොරතුරු අසා එම රැස්වීම් මාලාවේ මා කළ සේවය ගැන අගය කිරීමක් කළේය.

තවද හෙට උදෑසන 4.00 ට ගුවන්තොටුපොලේදී ඔහුව හමුවෙන්නට පුළුවන්ද කියා ඔහු මගෙන් ඇසුවේය. මන්ද ඔහු ඉන්දියාවෙන් පිටත්වීමට නියමිතව තිබුනේ එම වේලාවේදීය. එම වේලාව උදේ පාන්දර නිසා මට එන්නට නොහැකිය කියා පැවසීය. මන්ද මා ළඟ තිබුනේ පරණ බයිසිකලයකි. ගුවන් තොටුපළ පිහිටා තිබුනේ මා සිටි ස්ථානයේ සිට 25km ක දුරින්ය.

ඔහු එම මොහොතේම අප රටේ සිටි ප්‍රසිද්ධ ඉවැන්ජලිස්තවරයෙකුට කථාකොට මෙසේ පවසනු ලැබීය. ‘‘මොහු සෑම් සෙල්ව රාජ් මොහු මේ රැස්වීම් මාලාවේදී ඉතාම කඩිසරව ස්වේච්ඡා සේවය කළා. මා ඔහු තුළින් විශේෂ දෙයක් දකිනවා. මා ඉන්දියාවෙන් නැවත යාමට පෙර ගුවන්තොටුපලේදී ඔහු සමඟ සුළු මොහොතක් ගත කිරීමට කැමතියි. ඔහු දුප්පත් නිසාත් ඔහුගේ නිවසේ සිට ගුවන්තොටුපළ වෙත උදේ පාන්දරින්ම ඒමට නොහැකි නිසාත් මා කැමතියි ඔබගේ කාරයෙන් ඔහුවත් රැගෙන එන්න.’’ ය කියා ඔහු පැවසූ නමුත් මේ ඉවැන්ජලිස්තවරයා මා ගැන තරහා ගොස් ඔහුට මෙසේ පිළිතුරු දුන්නේය. ‘‘මේ පුද්ගලයාව රැගෙන එන්න මාගේ කාරයේ ඉඩ නැහැ.’’ කියාය. එවිට මේ දේශකයා ඇසුවා, ‘ඔබත් සමඟ වෙන කවුරු හෝ කෙනෙක් යනවාද?’’ කියා එවිට ඔහු ‘‘නැහැ, මට ඔහුව ගුවන්තොටුපල වෙතට ගෙන එන්න බැහැ’’ කියා පැවසීය.

මෙම දේව දාසයා ඔහු දුන් පිළිතුර නිසා මහත් පුදුමයකට පත්විය. ඔහු මට කථාකොට ඔහුගේ අත මගේ හිසමත තබා කඳුළු සමඟ මට යාච්ඤා කළේය. ඔහු යාච්ඤා කරනු ලැබුවේ මට ලෞකික ආශිර්වාදයන්ද ලබා දෙන්නය කියාය. ‘‘සහෝදර සෑම්, ඔබ ඉතා යටහත් පහත් සේවකයෙක්ය කියා මා දන්නවා. අද මා ඔබටත් ඔබගේ සේවයටත් අනාවැකි පවසනවා. මා සේවය කරන ස්වර්ගයේ දෙවියන්වහන්සේ ස්වර්ගයේ කවුළු විවෘත කරමින් ඔබට ආශිර්වාද කර බොහෝ කාර්, බස්, මේ ඉන්දියාවේ සේවය නිසා බොහෝ දේ උන්වහන්සේ ඔබට දෙන්න යනවා, ඔබව ගුවන්තොටුපොල වෙතට රැගෙන එන්න බැහැ, කියා පැවසූ සහෝදරයා සමඟ කිසි තිත්තකමක් තබා නොගන්න’’ කියා යාච්ඤා කළේය. මේ අවස්ථාවේදී මට වූ අසාධාරණය ගැන මා හට වේදනාවක් ආවේ නැහැ. නමුත් මේ බලවත් දේව දාසයා මට යාච්ඤාකළ එක ගැන මා ඉතා සතුටු වෙමි.

මෙසේ කාලය ගතවී ගියේය. දෙවියන්වහන්සේ මට ආශිර්වාද කිරීමට පටන්ගත්තේය. උන්වහන්සේ මට වාහන දුන්නා. සේවා ස්ථාන ලබා දුන්නා. එදා මට යන්නට නොහැකි වූ ගුවන්තොටුපළ තුළින්, බොහෝ රටවල් වලට යාමට උන්වහන්සේ උපකාර කළේය. අපට සිටින්නේ කොතරම් යහපත් දෙවිකෙනෙක්ද? මේ දෙවියන්වහන්සේ ජීවමානයි.

මාගේ ප්‍රිය සහෝදරයා, ඔබව අනෙක් අය ගණන් ගන්නේ නැතිව, ඔබ තුළ තිබෙන්නාවූ ආලේපය සුළුවට ගන්නවාද? ඔබ දැන් සිටින තත්වය, ගැන ඔබ කණගාටු වෙනවාද? ඔබව මනුෂ්‍යයන් අඩුතක්සේරුවට ගෙන තිබෙනවාද? දෙවියන්වහන්සේ මෙසේ පවසයි, ***‘‘නුඹලාගේ සිත් නොකළඹවා දෙවියන්වහන්සේ කෙරේ විශ්වාස කරපල්ලා. මා කෙරේ විශ්වාස කරපල්ලා. (යොහාන් 14:18)***

**දෙවියන්වහන්සේ ඔබට ආශිර්වාද කරන සේක්වා.**

*9 වෙනි පිටුවෙන්...*

දෙවියන්වහන්සේ මෝසෙස්ට උන්වහන්සේගේ ස්වභාවය පෙන්නුම් කළේය. ''**....වරදර කරුවන් කවර ප්‍රකාරයකින්වත් නිදහස් නොකරනසේක...**'' (නික්මයාම 34:7) අසිරියා ආසා රජතුමාට අනාවැකිය දුනේනේ මේ ආකාරයටය. '

***''නුඹලා ස්වාමීන්වහන්සේ සමඟ සිටිනතුරු උන්වහන්සේ නුඹලා සමඟ සිටිනසේක, නුඹලා උන්වහන්සේ සොයනවා නම්, උන්වහන්සේ නුඹලාට සම්බවෙනවා ඇත. නුඹලා උන්වහන්සේ අතහැරියොත් උන්වහන්සේද නුඹලා අත්හරිනවා ඇත.'' (2 ලේකම් 15:2)***

දෙවියන්වහන්සේ අපට පවසන්නාවූ දේ ඉතාම සරළය. කාලයක් ගෙන දෙවියන්වහන්සේ ගැන හොඳට දැනගන්න. ඔබගේ යාච්ඤාවෙන් මාගේ මුහුණ සොයමින් මාගේ වචනයත් සොයන්න. මාගේ අභිමුඛත්වය තුළ ඔබ රඳාපවතින විට මාගේ තේජස දකින පිණිස ඔබගේ ඇස් විවෘතවන සේක. ක්‍රිස්තුස්වහන්සේ ඔබට එළිදරව් වනසේක.

මේ එළිදරව්ව තුළින් ඔබ ජීවත්වන විට ඔබගේ මුළු ජීවිතයම පවිත්‍ර වන්නේය. ඔබගේ ජීවිතයේ ඔබ සම්පූර්ණ ප්‍රේමයෙන්ද කරුණාවෙන්ද දයාවෙන්ද පිරි අන් අයටද දෙවියන්වහන්සේ එළිදරව් වෙන්නාවූ කෙනෙක් වන්නේය.

ස්වාමීන්වහන්සේ දෙස පමණක් බලන්න. අන් අය දෙස නොබලන්න. ''***....ස්වාමීන්වහන්සේ කෙරෙහි සම්පූර්ණ සිත් ඇත්තන්ට පිහිටවෙන පිණිස උන්වහන්සේගේ බලය පාමින් උන්වහන්සේගේ ඇස් පොළොව මුළුල්ලෙහි ඔබමොබ දුවන්නේය...'' (2 ලේකම් 16:9)***

ස්වාමීන්වහන්සේව ඔබගේ මුළු හදවතින්ම සොයන්න. ඔබගේ ජීවිතය උන්වහන්සේගේ අභිමුඛයෙහි දිනපතාම තබාගන්න. එවිට උන්වහන්සේගේ තේජාන්විත වූ එළිදරව්ව ඔබට දිනපතා ලැබෙන්නේය.

Kindly Pray for **St. Paul's Matriculation School** and **Nehemiah Bible Colleges.**

**කරුණාකර අප ප්‍රධාන සභාවේ සේවාවන් උදෙසා යාච්ඤා කරන්න.**

1. යාච්ඤා සේවය - පැය 24 පුරා
2. බයිබල් තැපැල් පාඩම් මාලාව - ඉංග්‍රීසි, දෙමල හා හින්දි
3. කැඳවීමේ ප්‍රතිරාවය - මාසික සඟරාවන්
   දෙමල, ඉංග්‍රීසි, මලයාලම්, තෙලගු, හින්දි, මරාති, කන්නඩා, බෙංගාලි, ගුජරාති, ඔරියා, නේපාලි, අසාමි, පංජාබි, උර්දු, සිංහල සහ අප්‍රිකානාස්
4. නෙහෙමියා බයිබල් විද්‍යාල
5. තැපැල් මාර්ගික බයිබල් පාඨමාලාව - දෙමල සහ ඉංග්‍රීසි
6. පුහුණුවීමේ වැඩසටහන්
7. චිත්‍රපටි සේවය සහ ශුභ ආරංචි රැස්වීම්
8. ශුභ ආරංචි පත්‍රිකා මුද්‍රණය කිරීම - ප්‍රකාශනය කිරීම.
9. මුද්‍රිත සේවය පවත්වාගෙන යාම.
10. ශාන්ත පාවුල් මෙට්‍රිකියුලේෂන් පාසල
11. සබත් පාසල - ඉරිදා පෙ.ව 8.30
12. දෙමළ භාෂාවෙන් දේව මෙහෙය - ඉරිදා පෙ.ව 5.00, 7.00 හා 10.00
13. තෙලෙගු භාෂාවෙන් දේව මෙහෙය - ඉරිදා ප.ව 4.00
14. හින්දි භාෂාවෙන් දේව මෙහෙය - ඉරිදා ප.ව 5.00
15. මලයාලම් භාෂාවෙන් දේව මෙහෙය- ඉරිදා ප.ව 5.00
16. ඉංග්‍රීසි සහ දෙමළ භාෂාවෙන් දේව මෙහෙය - ඉරිදා ප.ව 6.00
17. පත්‍රිකා බෙදා හැරීම. - ඉරිදා ප.ව 2.30
18. පාලක වරුන්ට උපදෙස් දීම. - ඉරිදා ප.ව 4.00
19. කාන්තා යාච්ඤාව - බදාදා ප.ව 5.30
20. සති මැද නමස්කාර දේව මෙහෙය
21. පුරුෂයින්ගේ යාච්ඤාව - සිකුරාදා ප.ව 8.00
22. සෙනසුරාදා දේව මෙහෙය - ප.ව 5.00
23. සේවකයින්ගේ රැස්වීම - සෙනසුරාදා ප.ව 6.00
24. ගෘහ රැස්වීම් - අඟහරුවාදා, බ්‍රහස්පතින්දා සහ සිකුරාදා ප.ව 6.30
25. විශේෂ රාත්‍රි භෝජනය - පළමු ඉරිදා උදෑසන 5.30
26. දෙමාපියන්ගේ යාච්ඤාව - පළමු ඉරිදා ප.ව 4.00
27 උපවාස යාච්ඤාව - පළමු සෙනසුරාදා පෙ.ව 9.30
28. සර්ව රාත්‍රි යාච්ඤාව - දෙවෙනි සිකුරාදා ප.ව 9.30
29. ශුද්ධවූ රාත්‍රි භෝජනය - දෙවන ඉරුදින දේව මෙහෙය
30. දිනපතා උදෑසන දේව මෙහෙය - පෙ. ව 5.00
31. කාර්යාල මණ්ඩලයේ මෙනෙහි කිරීම - දිනපතා පෙ.ව 9.00
32. කාර්යාල සේවය - දිනපතා පෙ.ව 9.00 සිට ප.ව 9.00

**Regd. with the Registrar of Newspapers for India under No. TN/SIH/2006/17846**
**Date of Publication: First week of every month**
**Date of Posting : 1st & 2nd of every month**
**Posted at "Egmore RMS / 1 Patrika Channel"**
**on 28th AUGUST 2020**
**If un-delivered please return to:**

**ECHO OF HIS CALL (SINHALA)**
**P.O. Box No. 2957,**
**Chepauk, Chennai - 600 005, INDIA.**
**Phone: (+ 91- 44) 2852 8282, 2852 9293, 2854 7766**

***JESUS LOVES YOU!***

**To**

*GOD BLESS YOU!*

Owned and published by **S. Sam Selva Raj** from Old No.18, New No. 10, Mohammed Abdullah 2nd Street, Chepauk, Chennai-600 005 and printed by him at **Echo of His Call Printers** Old No. 18, New No. 10, Mohammed Abdullah 2nd Street, Chepauk, Chennai-600 005. Editor: **S. Sam Selva Raj.**